කාන්තාවක් බුද්ධ ශීර්ෂයට සමාන රූපයක් මුද්‍රිත සාරියක් හැඳගෙන සිටි බවට කියැවෙන සිදුවීමක් සම්බන්ධයෙන් ඇයව පොලිසිය විසින් අත්අඩංගුවට ගැනීම අද දින පුවත්පත් ඔස්සේ වාර්තා කෙරී තිබිණි. මෙහිදී අරුණ, දිවයින සහ ලංකාදීප පුවත්පත් සිරස්තල තුළ, මෙම සිදුවීම කිසිදු පූර්ව විනිශ්චයකින් තොරව දක්වා තිබිණි. මේ අතර මෙම සිදුවීම වාර්තා කරනා මව්බිම සිය සිරස්තලය ලෙසින් යොදාගන්නේ "බුදුන්ට අපහාස කළ කතක් අත්අඩංගුවට" යන්නයි.

ජනමාධ්‍යයක කාර්ය භාරය වන්නේ යම් කිසි සිදුවීමක් සඳහා අත්අඩංගුවට ගත් පුද්ගලයෙකු සම්බන්ධයෙන් නීතියෙන් විනිශ්චයක් ලැබීමට පෙරාතුව, 'මාධ්‍ය විනිශ්චයක්' ලබාදීමද? එසේ නැතිනම් අපක්ෂපාතී හා සමබර ලෙසින් සිදුවීම වාර්තා කිරීමද? ඒ අනුව ගත් විට මව්බිම සිරස්තලය සැකකරුවෙකුට පූර්ව විනිශ්චය ලබාදීමක් යැයි ඔබ නොසිතන්නේද? එය වගකීම් සහගත මාධ්‍යකරණය යැයි ඔබ සිතන්නේද?

**#MediaEthicsSL #lka #SinhalaPress #Mawbima #Aruna #Lankadeepa #Divaina**
See Less